මාධ්‍ය නිවේදනය

2019 මාර්තු 11 කොළඹදී...

Nestlé
Good Food, Good Life

## ඔබේ ප්‍රියතම නූඩ්ල්ස් නිෂ්පාදනයේ නව රස වෙනස - මැගී දයියා චීසි නූඩ්ල්ස්!

නව ආහාර නිෂ්පාදනවලින් ශ්‍රී ලාංකේය අපට රස ගුණ ලබාදෙන මැගී දැන් අලුත්ම නූඩ්ල්ස් වර්ගයක් හඳුන්වා දී ඇත. 'මැගී දයියා චීසි නූඩ්ල්ස්' ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට නව ආරක රසයක්, 'චීස්' සහ 'ගම්මිරිස්' රස එකතුවකින් ක්‍රීම් දයියා අත්දැකීමක් රස විඳීමට අවස්ථාව සලසා ඇත. රසවත් චෙඩාර් චීස් පවුඩර් යොදන ලද මෙම නව නිෂ්පාදනයට ගම්මිරිස්, ළූණු, සුදුළූණු, මිරිස් වැනි කුළුබඩු එකතුවකින් 'දයියා' රසය ඉස්මතු කරයි. තවත් සුවිශේෂී කරුණක් වන්නේ, මෙහි ක්‍රීම් ගතිය වැඩි කරගැනීමට එයට කිරි එකතු කිරීමයි. රසයෙන් හා ගුණයෙන් පිරුණු ඉක්මන් හා පහසු ආහාරවේලක් පිළියෙල කරගැනීමට රිසි සෑම පවුලකට ම මැගී දයියා චීසි නූඩ්ල්ස් යනු කදිම තෝරාගැනීමකි.

"නවතම රසයන්, විවිධතා සහ නව ආහාර අමුද්‍රව්‍ය එක්කරමින් ගෙවුණු වසර කිහිපය පුරාවටම නවෝත්පාදනය පෙරටු කරගත් ගමනක නිරතවීමට මැගී සමත්වුණා. ශ්‍රී ලාංකේය යොවුන් පිරිස දිනෙන් දින විවිධ රස වර්ග රස විඳීමට, විශේෂයෙන් 'සැර ආහාර වර්ග' සඳහා විශේෂ නැඹුරුතාවයක් ඇති බව අපගේ සමීක්ෂණවලින් තහවුරු වුණා. ඒ වගේම ඔවුන් කැමති ආහාර තෝරාගැනීම් අතුරින් 'චීස්' සඳහා විශේෂ කැමැත්තක් ඇති බවත් අපි දැනුවත් වුණා. එම දැනුම මත අපි මාතලේ දිස්ත්‍රික්කයෙන් සපයාගත් හොඳම ගම්මිරිස් ඇතුළු සැබෑ කුළුබඩු සහ චීස් පවුඩර් යොදමින් අපේ පාරිභෝගිකයන් ඇලුම් කරන 'සැර-චීස්' නූඩ්ල්ස් නිෂ්පාදනයක් හඳුන්වාදුන්නා. මේ නව නිෂ්පාදනය දිවයින පුරා ඇති වෙළෙඳසැල්වලදී දැන් මිලදීගන්නට පුළුවන් අතර එය එනතුරු බලා සිටි මැගී රසිකයින් සැමටම එහි රසය බැලීමට අපි ආරාධනා කරනවා" යනුවෙන් නෙස්ලේ ලංකාහි ආහාර අංශයේ උප සභාපතිනී ප්‍රියදර්ශිනී කරුණාරත්න මහත්මිය පැවසුවාය.

මැගී නූඩ්ල්ස් නිෂ්පාදනය කරනු ලබන්නේ යහගුණ පිරි තිරිඟු පිටි සහ කැල්සියම් යොදාගනිමිනි. එම නූඩ්ල්ස් පෙළෙහි රසය වැඩිදියුණු කිරීම සඳහා මැගී, ශ්‍රී ලාංකික ආහාර පිසීමේදී විශ්වාසය හා කැමැත්ත දිනාගත් සාම්ප්‍රදායික කුළුබඩු හා ඖෂධීය පැළෑටි යොදාගනියි. ඊට කොත්තමල්ලි, කරඳමුංගු, කහ, සුදුරු, ගම්මිරිස්, සාදික්කා, උළුහාල්, ඇනිසි, මිරිස්, සුදුළූණු, ඉඟුරු, රම්පේ සහ කරපිංචා අන්තර්ගත වේ. මැගී නූඩ්ල්ස් ශ්‍රී ලංකාවේ පසුගිය දශක තුන පුරාවට රස ගුණ ලබාදුන් ජනතා ආදරය හා විශ්වාස දිනූ වෙළෙඳ නාමයකි. තව ද #MyMaggiMyTaste සන්නාම පොරොන්දුව මත මෘදු රස මෙන්ම සැර රස දක්වා විවිධාකාර රස බැලීම් හඳුන්වාදීමට ද මැගී පියවර ගෙන තිබේ.

.................................................................................................................................